## ශ්‍රී ලංකා
## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## පාර්ලිමේන්තුව

# 1985 අංක 54 දරන
# පිරිවැටුම් බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1986 ජනවාරි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ගත හැක

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1985 අංක 54 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 31 වන දින.]

එල්. ඩී.—ඔ. 64/85.

## 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1985 අංක 54 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**1981 අංක 69 දරන පනතේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 21 වන වගන්තියේ "අවසානාත්මක හා තීරණාත්මක වන්නා වූ අවස්ථාවක," යන වචන සිට "ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය." යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "අවසානාත්මක හා තීරණාත්මක වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ස්වකීය වාර්තාවේ පිරිවැටුම එළිදරව් කිරීමේ දී හෝ ඒ පිරිවැටුම සම්බන්ධ පිරිවැටුම් බදු අනුප්‍රමාණය අදාළ කිරීමේ දී හෝ වංචාවක් හෝ ඔනෑකමින්ම පැහැර හැරීමක් සිදු වී නොමැති බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි සනාථ කරනු ලබන්නේ නම් මිස, සාවද්‍ය වාර්තාවක් පිළියෙල කිරීම සඳහා හෝ තම වාර්තාවෙහි දක්වා ඇති පිරිවැටුමට සම්බන්ධ සාවද්‍ය පිරිවැටුම් බදු අනුප්‍රමාණයක් අදාළ කිරීම සඳහා දණ්ඩනය වශයෙන් රුපියල් දෙදහසක් නොඉක්මවන මුදලක් හා තක්සේරුවෙන් හිමිකම් පා සිටින මුළු පිරිවැටුම් බද්ද සහ වාර්තාව මත ගෙවනු ලබන පිරිවැටුම් බද්ද අතර ඇති වෙනස මෙන් දෙගුණයකට සමාන මුදලක් ගෙවන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ලියවිල්ලක් මගින් නියම කරනු ලැබිය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(6) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ

යම් තැනැත්තකු විසින් හෝ මේ පනත සාධාරණ ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ අවශ්‍යතාව කෙරෙහි සැලකිල්ල ඇතිව, යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන්—

(අ) ඒ ප්‍රදේශයේ පිරිවැටුම් බදු ගෙවන්නන්ගේ නම් සහ ලිපිනයන් ;

(ආ) ඒ එක් එක් බදුගෙවන්නා විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරය පිළිබඳ විස්තරයක් ; සහ

(ඇ) කාර්තුවක් සඳහා ඒ එක් එක් පිරිවැටුම් බදු ගෙවන්නා විසින් ප්‍රකාශිත පිරිවැටුම

ඇතුළත් ලැයිස්තුවක්, අවස්ථානුකූල යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන ආකාරයකින් පළ කරනු ලැබීමට සැලැස්විය හැකි ය. ".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා ඊළඟ වර්ෂයේ පිටපත් ලබාගත හැකිය.